# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 2054 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 01/08/2024<br>පැය 0615 |

# මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

## 01. වෙඩි වැදීමකින් පුද්ගලයෙකු රෝහල් ගත කිරීමක් - පොළොන්නරුව පොලිස් වසම.

2024.07.31 වන දින උදෑසන කාලයේ පොළොන්නරුව පොලිස් වසමේ සේවාගම ප්‍රදේශයේ පුද්ගලයෙකු වෙඩි වැදීමක් හේතුවෙන් පොළොන්නරුව රෝහලට ඇතුලත් කර ඇති බවට ලද පණිවිඩයක් මත පොළොන්නරුව පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**තුවාලකරු වයස අවුරුදු 46 ක් වූ සේවාගම, පොළොන්නරුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තුවාලකරු වදුරන් පැන්නීමට තම බලපත්‍ර සහිත බෝර 12 ගිනි අවිය රැගෙන ඉඩමේ යමින් සිටියදී පය පැටලී වැටී ගිනි අවිය ක්‍රියාත්මක වී වෙඩි වැදීම සිදුව ඇති බවට බිරිඳ විසින් ප්‍රකාශයක් ලබා දී ඇත. තුවාලකරු ව්‍යාපාරික ණය හේතුවෙන් දැඩි මානසික පීඩනයකින් පසුවූ බවට අනාවරණය වී ඇති අතර, මේ හේතුවෙන් වෙඩි තබාගෙන සිය දිවි හානි කර ගැනීමට උත්සාහ කර ඇතිද යන්න සම්බන්ධයෙන් පොලිසිය සැකකරනු ලබයි. පොළොන්නරුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

## 02. **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය.**

2024.07.31 වන දින සවස් කාලයේ එගොඩඋයන පොලිස් වසමේ මෝදර ප්‍රදේශයේදී බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 22 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන එගොඩඋයන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

එගොඩඋයන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. **හෙරොයින් සමග සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.07.31 වන දින ගල්කිස්ස පොලිස් වසමේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීම් 03 ක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 500 ක්, හෙරොයින් ග්‍රෑම් 06 ක් සහ හෙරොයින් ග්‍රෑම් 05 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් තිදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 26, 32 හා 40 වයස්වල පසුවන කොළඹ 15, කළුබෝවිල හා බන්ඩාරගම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ගල්කිස්ස පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. **හෙරොයින් සමග සැකකරුවකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.07.31 වන දින සවස් කාලයේදී ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන දුම්රිය ස්ථානය අසලදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 250 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. **හෙරොයින් සමග සැකකරුවකු අත්අඩංගුවට - අතුරුගිරිය පොලිස් ස්ථානය.**

2024.07.31 වන දින සවස් කාලයේදී අතුරුගිරිය පොලිස් වසමේ පනාගොඩ ප්‍රදේශයේදී අතුරුගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 400 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුගිරිය පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**06. හෙරොයින් සමග සැකකරුවකු අත්අඩංගුවට - ජාඇල පොලිස් ස්ථානය.**

2024.07.31 වන දින සවස් කාලයේදී ජාඇල පොලිස් වසමේ ක්ෂේවියර් මාවතේදී ජාඇල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 130 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන ඉඹුල්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ජාඇල පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**07. පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් 04 දෙනෙකු අත්අඩංගුවට - ගලෙන්බිඳුණුවැව පොලිස් ස්ථානය.**

2024.07.31 වන දින සවස් කාලයේ ගලෙන්බිඳුණුවැව පොලිස් වසමේ තෙළඹුගස්වැව ප්‍රදේශයේ පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරන බවට ගලෙන්බිඳුණුවැව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් 04 දෙනෙකු කැණීම් උපකරණ සමග අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 35, 37, 60 හා 65 වයස්වල පසුවන පයාගල හා ගලෙන්බිඳුණුවැව ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ගලෙන්බිඳුණුවැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් 04 දෙනෙකු අත්අඩංගුවට - අනුරාධපුර පොලිස් ස්ථානය.**

2024.07.31 වන දින සවස් කාලයේ අනුරාධපුර පොලිස් වසමේ විජේපුර ප්‍රදේශයේ පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරන බවට අනුරාධපුර පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් 05 දෙනෙකු කැණීම් උපකරණ සහ පූජා භාණ්ඩ සමග අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 23, 33, 40, 46 හා 50 වයස්වල පසුවන චීන වරාය, අම්බලන්තොට, දික්වැල්ල හා අනුරාධපුර ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

අනුරාධපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**09. වීසා නොමැතිව මෙරට රැඳී සිටි විදේශිකයන් 06 දෙනෙකු අත්අඩංගුවට - පයාගල පොලිස් ස්ථානය.**

2024.07.31 වන දින උදෑසන කාලයේ පයාගල පොලිස් වසමේ පයාගල ප්‍රදේශයේ දී ආගමන විගමන කොන්දේසි උල්ලංඝණය කරමින් වීසා නොමැතිව

මෙරට රැදී සිටි විදේශිකයන් 06 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. මොවුන් අතර පුද්ගලයන් 05 දෙනෙකු සහ කාන්තාවක් සිටී.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 20, 22, 24, 27, 39 වයස්වල පසුවන අතර, සැකකාරිය වයස අවුරුදු 48 ක් වන චීන ජාතිකයන් වේ.**

පයාගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවකු අත්අඩංගුවට - හොරණ පොලිස් ස්ථානය.

2024.07.31 වන දින අළුයම් කාලයේදී හොරණ පොලිස් වසමේ ඉළිඹ ප්‍රදේශයේදී හොරණ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 52.5 ක් සහ පෙරීමේ උපකරණ සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන හොරණ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හොරණ පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 11. ගෝඩා සමග සැකකරුවකු අත්අඩංගුවට - මීගොඩ පොලිස් ස්ථානය.

2024.07.31 වන දින සවස් කාලයේදී මීගොඩ පොලිස් වසමේ හොරගල ප්‍රදේශයේදී මීගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් පෙරීමට ගන්නා ගෝඩා ලීටර් 1320 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන පාදුක්ක ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීගොඩ පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 12. විදුලි සැර වැදී මියයාමක් - තලාතුඔය පොලිස් වසම.

2024.07.31 වන දින උදෑසන කාලයේ තලාතුඔය පොලිස් වසමේ පැරණි ජනපදය ප්‍රදේශයේ පුද්ගලයෙකු විදුලි සැර වැදීමකින් මියගොස් ඇති බවට තලාතුඔය පොලිසියට ලද පණිවිඩයකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 79 ක් වන පැරණි ජනපදය, ඇතුල්ගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම අනවසර විදුලි රැහැන මරණකරු සහ අසලවැසි පුද්ගලයෙකු සමඟ එම අයගේ නිවසෙන් සතුන් දඩයම් කිරීමේ අරමුණින් ඇද ඇති බවත් මරණකරු සතුන් පැටලී ඇත්ද සම්බන්ධව පරීක්ෂා කිරීමට යාමේදී විදුලි සැර වැදී ඇති බවට

විමර්ශන වලදී අනාවරණය වී ඇත. මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදුකර මහනුවර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනවසරයෙන් විදුලි රැහැන් අදින ලද වයස අවුරුදු 63 ක් වන ඉහත ප්‍රදේශයේ පදිංචි අනෙක් පුද්ගලයා පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත. තලාතුඔය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

## 13. විදුලි සැර වැදී මියයාමක් - නවගත්තේගම පොලිස් වසම.

2024.07.31 වන දින රාත්‍රී කාලයේ නවගත්තේගම පොලිස් වසමේ පැරකුම්පුර ප්‍රදේශයේ පුද්ගලයෙකු විදුලි සැර වැදීමකින් මියගොස් ඇති බවට නවගත්තේගම පොලිසියට ලද පැමිණිල්ලකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 34 ක් වන මුල්ලේගම, නවගත්තේගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය සම්බන්ධයෙන් හදිසි මරණ පරීක්ෂණය සිදුකර පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මරණකරු විසින් ඔහුගේ බුලත් වගාවට ජලය ලබා ගැනීමට සවි කර තිබූ වතුර මෝටරයට විදුලිය සම්බන්ධ කරන ලද වයරයෙන් විදුලි සැර වැදී මියගොස් ඇති බවට සිදුකළ විමර්ශනයේදී අනාවරණය වී ඇත. නවගත්තේගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

## 14. සැකකටයුතු මරණයක් - ගල්කිරියාගම පොලිස් වසම.

2024.07.31 වන දින උදෑසන කාලයේ ගල්කිරියාගම පොලිස් වසමේ බලලුවැව ප්‍රදේශයේ නිවසක ඇඳක් මත පුද්ගලයෙකු සැකකටයුතු ලෙස මියගොස් ඇති බවට ගල්කිරියාගම පොලිසියට ලද පණිවිඩයකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 56 ක් වන ජයමාවත හන්දිය, බලලුවැව ඉහත නිවසේ තාවකාලිකව පදිංචි කලාවැව, අනුරාධපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම මරණකරු අසල හෝටලයක සේවකයෙකු වශයෙන් කටයුතු කරනු ලබන අතර, ඔහු මෙම නිවසේ කාමරයක නැවතී සිට ඇත. මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදුකර දඹුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ගල්කිරියාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

## 15. නාඳුනන මළ සිරුරක් - පල්ලෙකැලේ පොලිස් වසම.

2024.07.31 වන දින දහවල් කාලයේ පල්ලෙකැලේ පොලිස් වසමේ වික්ටෝරියා ජලාශයේ නාඳුනන කාන්තා මළ සිරුරක් ඇති බවට ලද 119 තොරතුරු මධ්‍යස්ථානයෙන් ලද පණිවිඩයකට අනුව පල්ලෙකැලේ පොලිසිය මගින් විමර්ශනයක් ආරම්භ කර ඇත.

**රූප විස්තර - දම්, කළු, සුදු හා කොල පැහැති කොටු සහිත අත් දිග හැට්ටයක් හැඳ සිටී. උස අඩි 05 ක් පමණ වේ.**

මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදුකර මහනුවර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මෘත ශරීරය හඳුනා ගත නොහැකි තත්ත්වයේ ඇත. පල්ලෙකැලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

## 16. මාරක රිය අනතුරක් - රාජාංගනය පොලිස් වසම.

2024.07.31 වන දින රාත්‍රී කාලයේ රාජාංගනය පොලිස් වසමේ ගොවිපල හන්දිය යාය 15 අතුරු මාර්ගයේ කිරිවල ප්‍රදේශයේ දී ගොවිපල හන්දිය සිට යාය 15 දෙසට ධාවනයවූ යතුරු පැදියක් ඉදිරියෙන් පැමිණි තවත් යතුරු පැදියක මුහුණට මුහුණ ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් එක් යතුරු පැදියක යතුරු පැදිකරු, අනෙක් යතුරු පැදියේ පැදිකාරිය සහ පසු පැදිකාරිය බරපතල තුවාල ලබා නොච්චියාගම රෝහලට ඇතුලත් කිරීමේදී පසු පැදිකාරියක් මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 39 ක් වන යාය 16, තරුණ ගොවිපල, පහලමාරගහවැව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය නොච්චියාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. තුවාලකරුවන් වැඩිදුර ප්‍රතිකාර සඳහා අනුරාධපුර රෝහල වෙත මාරු කර යවා ඇත. රාජාංගනය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**